**බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම**
**2012 අගෝස්තු මස 07 වන දින  පෙ.ව 9.30ට**

# න්‍යාය පත්‍රය

## I. සභාපතිතුමාගේ නිවේදන

## II. ලිපි ලේඛන පිළිගැන්වීම

## III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

## IV. පෙත්සම්

## V. ප්‍රශ්න

01. **ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට** :

(ප්‍ර/V (1)12/18)

අ. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වැලිහේන දේවස්ථාන භූමියේ ඔබ අමාත්‍යාංශයේ අරමුදල් මඟින් රුපියල් මිලියන හතක් (රු.7,000,000/-) වැය කර ඉදිකල සුපිරි වෙළඳ සැල (සුපර් මාකට්) ඉදිකිරීමට අදාළව කටාන ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුමක් ඇතිකර ගෙන තිබේද?

ආ. ඔබ අමාත්‍යාංශ අරමුදල් යොදා රජයට හෝ පළාත් සභාවට අයත් නොමැති පුද්ගලික ඉඩමක ඉදිකිරීම් සඳහා අවසර දිය හැකිද ?

ඇ. එකී ගිවිසුම අනුව කටාන ප්‍රාදේශීය සභාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද ?

ඈ. එකී සුපිරි වෙළඳ සැල ඉදිකිරීම නීති විරෝධී වන්නේද ?

ඉ. එකී ඉදිකිරීම සඳහා වැය කළ රුපියල් මිලියන හතක (රු.7,000,000/-) මුදල සම්බන්ධව සහ ඊට අනුමැතිය දීම සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

"*බස්නාහිර පළාතේ 2012 අංක ............... දරණ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය*"

**(දෙවන වර කියවීම)**

ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම
2012.07.17 දින සිදු කර ඇත.

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය** :

" වර්තමානයේදී පාසල් වල පවත්නා භෞතික සම්පත් බොහෝ සෙයින් සතුටුදායක මට්ටමක පවතී. එසේම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයද සතුටුදායක මට්ටමක පවතී. එසේ වුවත් පාසලක විදුහල්පතිවරයෙකු විශ්‍රාම යන විට අළුතින් විදුහල්පතිවරයෙකු පත් කිරීමට කාලයක් ගතවන අවස්ථා බොහෝ ඇති අතර, එවැනි අවස්ථාවලදී වැඩ බැලීමේ පදනම මත විදුහල්පතිවරයෙකු පත් කර පාසල පවත්වා ගෙන යනු ලබයි. එවැනි වැඩබලන විදුහල්පතිවරුන් විදුහල්පති තනතුරේ කොපමණ හොඳින් කටයුතු කලද ඔවුන්ට එම තනතුරේ ස්ථිර වීමට අවස්ථාවක් නොමැත. මෙවැනි තත්වයක් තුළ කොතරම් දියුණු මට්ටමක පැවති පාසලක්වුවත් පහළ මට්ටමකට වැටීමට ලක් විය හැක.

මෙම තත්වය මග හැරවීම සඳහා බස්නාහිර පළාත තුල සුදුසුකම් සහිත ගුරුවරුන් තෝරා පුහුණු කිරීමෙන් හෝ විදුහල්පති විභාග පවත්වා සුදුස්සන් තෝරා ගෙන විදුහල්පති සංචිතයක් ඇති කළ යුතු

යැයිද, යම් පාසලක විදුහල්පතිවරයෙකු විශ්‍රාම ලබන විටම ඒ වෙනුවට එම සංචිතයෙන් විදුහල්පතිවරයෙකු පත් කිරීමට පියවර ගත යුතු යැයිද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. ”

**(යෝ/v(01)12/07)**

**02. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :**

“ රට තුළ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වත්මන් රජය විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් පවතී. “ අපි වවමු රට නගමු ”, “ දිවි නැගුම ” හා “ පොහොර සහනාධාර ලබාදීම ” වැනි ව්‍යාපෘති මඟින් ඉහළ එළවළු හා පළතුරු ඵලදාවක් ලැබෙමින් පවතී. ඵලදාව නෙලන කාලයේදී එළවළු හා පළතුරු පහසු මිලකට ලබා ගත හැකි අතර, එම කාලවලදී අතිරික්ත ඵලදාව නිෂ්ප්‍රයෝජන ලෙස විනාශ වන අවස්ථා දක්නට ඇත. එම තත්ත්වය ගොවීන්ට පාරිභෝගිකයන්ට මෙන්ම රටේ සමස්ත ආර්ථිකයට අහිතකර ලෙස බලපායි. එබැවින් ආහාර භෝග නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කර ගොවීන් වෙත හඳුන්වා දීමෙන් ගොවීන්ට සිදු වන පාඩුව මගහැර වීමටත්, පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව සැලසීමටත් පියවර ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. ”

**(යෝ/v(01)12/08)**

## XI. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2012.07.18
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.